**හම්බන්තොට මහා නගර සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

------------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 25 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 21 දින සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 අප්‍රේල් 01 දින හම්බන්තොට මහා නගර සභාවක් බවට පත්කිරීමෙන් පසුව හම්බන්තොට ප්‍රාදේශීය සභාවෙන් පවරන ලද රු. 68,002,818 ක වත්කම් හා රු. 4,262,501 ක වගකීම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දින වන විට සභාව විසින් පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු. 5,951,563 ක් සහ සමාලෝචිත වර්ෂයට අදාල වියදම වූ රු. 178,429 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඇ) මහනැඟුම හා පළාත් නිශ්චිත කර්මාන්ත සඳහා සමාලෝචිත වර්ෂයේ සභාව වෙත ලැබී තිබුණු ප්‍රාග්ධන ආදායම රු. 36,182,909 ක් වුවද අය ශීර්ෂ 30381 න් ආදායම් හා වියදම් ගිණුමට ගෙන තිබුණේ රු. 36,896,957 ක් ලෙස රු. 714,048 ක් වැඩියෙනි.

(ඈ) ප්‍රධාන ලෙජරය අනුව ඉකුත් වර්ෂය වෙනුවෙන් ප්‍රතිපූර්ණය විය යුතු ප්‍රාග්ධන ආධාර වටිනාකම වූ රු. 28,254,882 න් රු. 28,065,713 ක් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණි. ඉකුත් වර්ෂයේ කර්මාන්ත වෙනුවෙන් තවදුරටත් ලැබිය යුතු රු. 189,169 ක මුදල සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ණයගැතියන් තුළ ඇතුළත්කර නොතිබුණි.

(ඉ) ප්‍රධාන ලෙජරයේ ප්‍රාග්ධන වැය (3 – 9) ගිණුමෙන් ආදායම් හා වියදම් ගිණුමට හර කළ යුතු වටිනාකම රු. 38,060,776 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමට ගෙන තිබුණේ රු. 37,588,674 ක් ලෙස රු. 472,102 ක් අඩුවෙනි.

(ඊ) සභාව විසින් ඉදිරි වර්ෂයට අදාලව දරන ලද එකතුව රු. 266,384 ක් වූ වියදම් සමාලෝචිත වසරේ වියදම් සේ සලකා ගිණුම්ගතකර තිබුණි.

### 1.3.2 ගෙවිය යුතු ගිණුම්
--------------------

ආසියානු සංවර්ධන බැංකුවේ ණය අංක 1204 ශ්‍රී (එස්එෆ්) යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් සපයන ලද යන්ත්‍ර සූත්‍ර වෙනුවෙන් සභාවට ලබාදී ඇති රු.895,136 ක ණය මුදල වෙනුවෙන් ණය වාරික මුදල් රු. 201,406 ක් හා පොලිය රු. 169,336 ක් ලෙස අර්ධ වාර්ෂික වාරික 09 ක් 2015 මැයි 18 දින වන විටත් ගෙවීමට කටයුතුකර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,071,810 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,491,342 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
-------------------

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය
----------------------------------------

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| i. | වරිපනම් හා බදු | 5,564 | 6,388 | 2,928 |
| ii. | බදු කුලී | 13,245 | 13,078 | 2,878 |
| iii. | බලපත්‍ර ගාස්තු | 1,578 | 1,883 | 50 |
| iv. | වෙනත් ආදායම් | 50,822 | 50,763 | 31,973 |

### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ආදායම රු. 2,903,886 ක්වූ අතර ඉන් රු. 225,922 ක් ඉකුත් වර්ෂයට අදාල හිඟ ආදායම් විය. මෙම හිඟ වරිපනම් බදු මුදල් අයකර ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 252 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.2.3 බදු කුලී

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කාමර කුලී එකතුව රු. 2,877,739 ක්වූ අතර මහා නගර සභා ආඥා පනතේ 253 (1) වගන්තිය ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතුකර නොතිබුණි.

(ආ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2011 ජනවාරි 01 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 06 වන වගන්තිය මගින් වසර 05 කට වරක් තක්සේරුගත බදු මුදල නව තක්සේරුවක් මගින් සංශෝධනය කළයුතු බව දක්වා තිබුණද, ඊට පටහැනිව හම්බන්තොට පොදු වෙළඳපොල බස්නැවතුම් පොල හා වෙළඳසංකීර්ණයේ කඩ කාමර වලින් 2007 පෙබරවාරි සිට අයකරන ලද බදු මුදල 2015 මාර්තු 18 දින වන විටත් අයකරමින් පැවතුණි.

(ඇ) 1980 සැප්තැම්බර් මස 15 වන දින සිට හම්බන්තොට තානායමෙහි කළමනාකරණය නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබුණි. නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සභාව එළැඹි ලිඛිත ගිවිසුමක් නොවූ අතර 2014 දෙසැම්බර් 31 දිනට රු. 2,230,000 ක මුදලක් හිඟව පැවතුණි. ගිවිසුම්ගත නොවීමත්, හිඟ බදු කුලී අයකර නොගැනීමත් හේතුවෙන් මෙම වටිනාකම් කපාහැරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත්කර තිබූ නමුත් විගණිත දිනය වූ 2015 මැයි 18 වන දින වන විටත් අනුමැතිය ලැබී නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 1,527,739 ක මුදලක් උසාවි දඩ හා මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

ආලෝකපුර පෙර පාසලේ පාලිකාවන් දෙදෙනෙකුට 2006 පෙබරවාරි සිට 2012 සැප්තැම්බර් කාලයට අදාලව ගෙවිය යුතු රු. 211,230 ක හිඟ සේවක අර්ථ සාධක අරමුදල් 2014 දෙසැම්බර් 04 දින ගෙවා තිබුණි. සේවක අර්ථ සාධක අරමුදලට නිසි අයුරින් දායක මුදල් නොගෙවීම නිසා රු. 67,230 ක අධිභාර මුදලක්ද ගෙවීමට සිදුව තිබූ අතර රු. 57,600 ක් වූ සේවක දායකත්ව මුදලද සභා අරමුදලින් ගෙවා තිබුණි. එසේ ගෙවන ලද රු. 57,600 ක මුදල පාලිකාවන් දෙදෙනාගෙන් අයකර ගැනීමට 2015 මැයි 18 දින වන විටත් ක්‍රියා කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.2 වගන්තිය අනුව අනුමත ස්වේච්ඡා සංවිධාන සඳහා ඉදිකිරීම් වැඩ පමණක් පැවරිය හැකි නමුත් සභාවට අයත් ට්‍රැක්ටරයක් හා ටේලර් තුනක් අලුත්වැඩියාව සඳහා ගොවි සංවිධානයක් වෙත පවරා 2013 දෙසැම්බර් 18 දින

රු. 113,300 ක මුදලක් ගෙවා තිබුණි. මෙම අලුත්වැඩියාවන් සඳහා රු. 182,110 ක භාණ්ඩ හා උපකරණ සභාව විසින් මිලදී ගෙන ගොවි සංවිධානය වෙත ලබාදී තිබුණි.

(ආ) සභාවට අයත් බස්රථය අලුත්වැඩියාව සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව මිළ ගණන් කැඳවීමකින් තොරව ආයතනයක් වෙත රු. 430,500 ක මුදලකට පවරා තිබුණි. අලුත්වැඩියාව අවසානයේ අදාල ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ රු. 841,200 ක බිල්පත්‍ර අනුව මුලින් එකඟ වී තිබූ මුදලට වඩා රු. 410,700 ක මුදලක් ගෙවා තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහාමාර්ග,වරාය හා නාවික අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජුලි 02 දිනැති අංක MPH/HYW/MNG/Cer/14-1 ලිපියේ 01 ඡේදය අනුව මහනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන මාර්ග සඳහා අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේදී අමුද්‍රව්‍ය මත එකතු කරනු ලබන සියයට 10 ක අමතර පිරිවැය එකතු නොකර ඇස්තමේන්තු සකස් කරන ලෙස දක්වා තිබුණද 2014 ජුලි 02 දිනෙන් පසුව සභාව විසින් ගිවිසුම් අත්සන් කර ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 32 ක් සඳහා එසේ කටයුතු නොකිරීම නිසා එකතුව රු. 169,730 ක මුදලක් වැඩිපුර ගෙවීම්කර තිබුණි.

(ආ) සභාව විසින් ක්‍රියාත්මකකර තිබූ කර්මාන්ත 03 ක මාර්ගවල පාදම සඳහා ABC මිශ්‍රණය යොදා ඇති බව දක්වමින් එකතුව රු. 71,316 ක මුදලක් ගෙවීම්කර තිබුණද, 2014 මැයි 15 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී එම මාර්ග සඳහා ABC මිශ්‍රණය යොදා නොමැති බව නිරීක්ෂණය වූ අතර කර්මාන්ත 03 ක් සඳහා එම මාර්ග වල පාදම සඳහා සහ ගල් කැට මතුපිට ගල් කුඩු ඇතිරීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රමාණයට වඩා ගල් කුඩු මිළදී ගෙන තිබීම නිසා එකතුව රු. 33,001 ක මුදලක් වැඩිපුර ගෙවීම්කර ඇති බව ද නිරීක්ෂණය විය.

**3.4 අවිධිමත් ගනුදෙනු**

**----------------------------**

දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගාල්ල සිට මාතර දක්වාවූ අදියර විවෘත කිරීම වෙනුවෙන් සුභපැතීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකිරීමට 2014 ජුනි 03 දින රු. 218,400 ක මුදලක් ගෙවීම් කර තිබුණි. මහා නගර සභා ආඥා පනතේ 188 (1) යටතේ මෙවැනි වියදම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**4. පද්ධති හා පාලනය**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය